[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම - 2023

06 ශ්‍රේණිය	විෂයය - භූගෝල විද්‍යාව	පත්‍රය I/II	පැය - 02 යි.

නම .....

I කොටස

- **ප්‍රශ්න අංක 01 සිට 20 දක්වා සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

පහත සඳහන් ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01).ශ්‍රී ලංකාවේ වයඹ පළාතට අයත් දිස්ත්‍රික්කය මින් කුමක් ද?
1).මහනුවර 2).කුරුණෑගල
3).මොනරාගල 4).අනුරාධපුර

02).ග්‍රාම නිලධාරි කොට්ඨාස කිහිපයක් එකතු වීමෙන් සෑදෙන පරිපාලන ඒකකය කුමක්ද?
1).දිස්ත්‍රික්කය 2).පළාත
3).ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය 4).පළාත් සභාව

03).නිවැරදිව දිශාව හඳුනාගැනීම සඳහා උපකාරී වන්නේ මින් කුමක්ද?
1).දුරදක්නය 2).වෝල් මීටරය
3).උත්තල කාචය 4).මාලිමාව

04).යම්කිසි ස්ථානයක කෙටි කාලයක් තුළ පවතින වායුගෝලයේ ස්වභාවය හඳුන්වන්නේ,
1).කාලගුණය නමිනි 2).දේශගුණය නමිනි
3).උන්නතාංශය නමිනි 4).පතන ශීඝ්‍රතාව නමිනි

05).සුළඟේ වේගය මැනීමට භාවිතා කරන උපකරණය හඳුන්වන්නේ,
1).සුළං දිශා දර්ශකය නමිනි 2).අනිලමානය නමිනි
3).වර්ෂාමානය නමිනි 4).උෂ්ණත්වමානය නමිනි

06).

I උෂ්ණත්වය	A පැයට කිලෝමීටර්
II වර්ෂාපතනය	B ඊතලයෙන් දක්වන දිශාව
III සුළඟේ වේගය	C සෙල්සියස් අංශක
IV සුළං හමන දිශාව	D මිලිමීටර්

ඉහත දැක්වෙන තත්ත්වයන් නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර කුමක්ද?
1).ABCD 2).CDAB 3).BADC 4).DCBA

07).පහත සඳහන් වන්නේ මෙරට පාරම්පරික කර්මාන්ත කිහිපයක් හා ඒ සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශයි. මෙය නිවැරදිව ගලපා පිළිතුර තෝරන්න.

I) පිත්තල භාණ්ඩ	A අම්බලන්ගොඩ
II) ලී බඩු	B රදාවඩුන්න
III) වේවැල් භාණ්ඩ	C පිළිමතාලව
IV) වෙස්මුහුණු	D මොරටුව

1).BACD 2).CBDA 3).ACDB 4).CDBA

LIVEWORKSHEETS

08).ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ වැවෙන බෝග වර්ගයකි,

1).ගම්මිරිස් 2).බඩඉරිඟු

3).තල 4).රටකජු

09).ඉස්ලාම් භක්තිකයන්ගේ ආගමික උත්සවය මින් කුමක්ද?

1).වේල් පෙරහැර 2).රාමසාන් උත්සවය

3).දීපවාලි උත්සවය 4).නත්තල් උත්සවය

10).කෘෂිකාර්මික කටයුතුවලදී පස සරු කිරීම සඳහා දායක වන සත්වයා වන්නේ,

1).ගැඩවිල් පනුවා 2).තලගොයා

3).ඇටිකුකුළා 4).මී මැස්සා

පහත අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා ඉදිරිපත් කර ඇති ප්‍රකාශ හරි නම් ✓ලකුණ ද, වැරදි නම් ✗ ලකුණද වරහන තුළ යොදන්න.

11).ජලවාෂ්ප ඝනීභවනය වීමෙන් වලාකුළු නිර්මාණය වේ. ( )

12).උෂ්ණත්වය හා තාපය ලබා දෙන්නේ චන්ද්‍රයා ය. ( )

13).ශ්‍රී ලංකා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මහනුවර පිහිටා ඇත. ( )

14).සූර්ය තාපය නිසා ගොඩබිම හා සාගරයේ ජලය වාෂ්ප බවට පත්වෙයි. ( )

15).සැඩ සුළඟ සැහැල්ලු මෙන්ම සෞම්‍යය සුළඟකි. ( )

අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

16). …… ශ්‍රී ලංකාවට එන සංචාරක පක්ෂියෙකි.

17).ගස්වල බීජ ව්‍යාප්තියට සහය වන සත්වයකු ලෙස…….. හැඳින්විය හැකිය.

18).රතු ලූනු, මිරිස්, දුම්කොළ ලංකාවේ…… ප්‍රදේශයේ වගා කරන බෝග වර්ග වේ.

19).ලංකාවේ පැදුරු කර්මාන්තය සඳහා…… ප්‍රදේශය ඉතා ප්‍රසිද්ධය.

20).භූමිය අවිධිමත් ලෙස පරිහරණය කිරීම නිසා……. සිදුවේ.

(උතුරු, වවුලා, දකුණු, අව්ව්ව්යා, දුම්බර, පාංශු ඛාදනය)

(ලකුණු 2×20=40)

LIVEWORKSHEETS